# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,469 — 1925ක්වූ ජූනි මස 19වෙනි දිනවූ සිකුරාදා.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

No. 4,300, S. P.—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1925ක්වූ අගෝස්තු මස 6වෙනි දිනවූ බෘහස්පතින්දා පස්වරු 1.30ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ ගඟබොඩපත්තුවේ කොරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 9ක්.

මුල් සිතියම 12,413. ගම—ඌරල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගුලුගහකන්ද | — | රජසන්තක | පිට්ටනිය | 0 | 0 | 22* |
| 2 | එම | — | එම | හුලුබැද්ද | 1 | 0 | 31* |
| 3 | එම | — | එම | එම | 0 | 2 | 4* |
| 4 | එම | ඌරල පදිංචි ඩී. ඇද්‍ර්. විජේනාරායන | එම | එම | 4 | 3 | 24 |
| | | | ගම—වදුරඹ. | | | | |
| 5 | එම | — | රජසන්තක | පිට්ටනිය සහ පතන | 0 | 2 | 1* |
| | | | ගම—මාබොටුවන. | | | | |
| 6 | එම | — | රජසන්තක | මහබැද්ද සහ පතන | 62 | 2 | 24 |
| 7 | එම | — | එම | පතන | 1 | 2 | 15* |
| 8 | එම | — | එම | එම | 0 | 0 | 26* |
| | | | ගම—වදුරඹ. | | | | |
| 9 | එම | — | රජසන්තක | එම | 0 | 3 | 4* |
| | | | ගම—මාබොටුවන. | | | | |
| 10 | දෙලෙමුල්ලේකුඹුරේඔවිට | — | චාර්ල්ස් ඩයස් වික්‍රමසිංහ | ඔවිට | 0 | 0 | 32 |
| 11 | ගුලුගහකන්ද | ඌරල පදිංචි ඩී. ඇද්‍ර්. විජේනාරායන | රජසන්තක | පතන | 20 | 1 | 21 |
| 12 | එම | — | එම | එම | 1 | 2 | 13* |
| 13 | එම | — | එම | එම | 0 | 2 | 16* |
| 14 | එම | — | එම | එම | 0 | 0 | 12* |
| 15 | එම | — | එම | එම | 0 | 1 | 26* |
| 16 | දෙලෙමුල්ලේඔවිට | — | ජේ. මාර්ලිස් | ඔවිට | 0 | [illegible] | 21 |
| 17 | දෙලෙමුල්ලේවත්ත | — | එම | වත්ත | 0 | 1 | 6 |
| 18 | ගුලුගහකන්ද | — | රජසන්තක | පතන | 0 | 1 | 11* |
| 19 | එම | — | එම | එම | 1 | 2 | 13* |
| 20 | කොස්ගහවත්ත | — | බී. ජී. උඩසිහාමි | වත්ත | 0 | 0 | 16 |
| 21 | ගුලුගහකන්ද | — | රජසන්තක | පතන | 0 | 1 | 1* |
| 22 | පැලැකට්ටියේවත්ත | — | ඇම්. පී. අගෝස්තිනා | වත්ත | 1 | 0 | 16 |
| 23 | ගුලුගහකන්ද | — | රජසන්තක | පතන | 0 | 1 | 13* |
| 24 | ගුලුගහකන්ද නොහොත් ලිදඅද්දරඔවිටගොඩ | මාබොටුවන පදිංචි ජේ. මාර්ලිස් ඩයස් | එම | එම | 0 | 1 | 0 |
| 25 | ගුලුගහකන්ද | — | එම | එම | 0 | 0 | 5* |

* හෙළනම් ඉඩම්, (විකිණීමට නොවේ.)

දැන්වීමයි:—මේ ඉඩම්වල තක්සේරුව විකුනන වේලාවේදී දැනුම්දෙනවා ඇත.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ගාල්ලේ මහා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්‍ෂ 1925ක්වූ ජූනි මස 16වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තාරිස් වමහ.

**No. 4,301, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 11වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1.30ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ ගඟබඩපත්තුවේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 19ක්.

මුල් සිතියම 12,650. ගම—උනන්විටිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකම්කියන්නා | අන්දම. | මහන. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගම්ගේකැකුලමේදූව .. | — .. | කේ. ජී. එපෝරිස් ද සිල්වා .. | එලවළුවතන .. | 0 | 0 | 5 |
| 2 | හිරලුගේවිලගොඩ බැද්ද නොහොත් ගම්ගේකැකුලමේදූව | — .. | හී. ඇල්. චාර්ල්ස් .. | පොල්වත්ත .. | 0 | 0 | 32 |
| 3 | දිගනන්කුඹුරේදෙනිය .. | — .. | ඇල්. ජී. යොහානිස් .. | එලවළුවතන .. | 0 | 0 | 20 |
| 4 | එම .. | *— .. | අයි. පී බර්ලියස් .. | වත්ත .. | 0 | 0 | 35 |
| 5 | එම .. | — .. | රජසන්තක .. | දෙනිය .. | 1 | 0 | 1 |
| 6 | වාඩියේවත්ත .. | — .. | (1) ඇල්. ජී. ජෙහානිස්, (2) ඇම්. පේද්‍රිස් | පොල්වත්ත .. | 0 | 1 | 4 |
| 7 | හිරලුගේවිලගොඩ බැද්ද නොහොත් ගමගේකැකුලමේදූව | — .. | රජසන්තක .. | සුලුබැද්ද .. | 0 | 3 | 30* |
| 8 | එම .. | — .. | එම .. | එම .. | 0 | 0 | 4* |
| 9 | එම .. | — .. | එම .. | එම .. | 0 | 3 | 10* |
| 10 | එම .. | වදුරඹ නිකොලස්හිල්ස් වත්තේ පදිංචි සී. ජී. බයස් මහතා | එම .. | එම . | 9 | 3 | 0 |

මුල් සිතියම 12,704. ගම—දෙමලගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකම්කියන්නා | අන්දම. | මහන. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කිරිමැටියකන්ද නොහොත් දූවිමිල්කන්ද | — .. | රජසන්තක .. | බැද්ද .. | 0 | 1 | 18* |
| 2 | වතුගඟුන්දූගේතේදෙනිය .. | — .. | පී පුන්චිබබා .. | වත්ත .. | 0 | 0 | 20 |
| 3 | කිරිමැටියකන්ද නොහොත් දූවිමිල්කන්ද | ගාල්ලේ පදිංචි වින්සන්ට් ඒ. ද සිල්වා | එම .. | බැද්ද .. | 10 | 0 | 16 |
| 4 | කිරිමැටියකන්දේඔවිට .. | — .. | කේ. හාන්දු .. | වත්ත .. | 0 | 1 | 10 |

මුල් සිතියම 12,726. ගම—වදුරඹ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකම්කියන්නා | අන්දම. | මහන. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | රිලාමුල්ලේඔකන්දේකුඹුර .. | — .. | (1) බී ජී. ජයනෝරිස්, (2) ඩබ්ලිව්. කරෙඅප්පු | දෙනිය .. | 0 | 0 | 35* |
| 2 | එම .. | — .. | රජසන්තක .. | දෙනිය .. | 0 | 2 | 18† |
| 3 | රිලාමුල්ලේ ඔකන්ද නොහොත් බෙලියත්තෙගොඩකන්ද | වදුරඹපදිංචි ඩබ්ලිව්. අමරසිංහ මහතා | එම .. | හේන .. | 0 | 2 | 25† |
| 4 | එම .. | — .. | එම .. | එම .. | 0 | 0 | 35† |
| 5 | බෙලිඅත්තේගොඩකන්ද .. | — .. | ගාල්ලේ පදිංචි ඇස්. පීරිස් .. | රබර්වත්ත .. | 0 | 0 | 8 |
| 6 | රිලාමුල්ලේඔකන්ද නොහොත් බෙලිඅත්තෙගොඩකන්ද නොහොත්පහලමුලගේගොඩකන්ද | — .. | රජසන්තක .. | හේන .. | 0 | 1 | 24* |
| 7 | එම .. | — .. | එම .. | එම .. | 2 | 0 | 12† |
| 8 | කිඹුලමලදෙනියේවත්ත .. | — .. | වදුරඹ පදිංචි ඇම්. අර්නෝලිස් | වත්ත .. | 0 | 2 | 12 |
| 9 | කිඹුලමලදෙනිය .. | — .. | එම .. | කුඹුර .. | 0 | 1 | 34 |
| 10 | කිඹුලමලදෙනියේඅත්මග .. | — .. | එම .. | වත්ත .. | 0 | 2 | 35 |
| 11 | පහලමුලගේගොඩකන්ද .. | — .. | රජසන්තක .. | හේන .. | 0 | 0 | 28* |
| 12 | එම .. | වදුරඹපදිංචි ඩබ්ලිව්. අමරසිංහ මහතා | එම .. | එම .. | 4 | 1 | 12† |

* තහනම් ඉඩම්, (විකිණීමට නොවේ.) † මෙම ඉඩම් කැබලි මිනිරන් හෑරීමේ බලයත් සමග විකුනනුලැබේ.

දැන්වීමයි: මෙම ඉඩම්වල තක්සේරුව විකුනන වේලාවේදී දන්වනුලැබේ.

මෙම ඉඩම් ගැන වැඩිපුර තොරතුරු ගාල්ලේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1925ක්වූ ජූනි මස 16වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම් වෙනුවට.

---

**No. 7,230, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ජූලි මස 31වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9·30ට නාලන්දේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ සිරවල්කරදෙන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ පලාතේ උතුරු මාතලේ උඩුගොඩ උඩසියපත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 6ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 31. ගම—වල්මෝරුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| .36 | කනුගොල්ලේ යායේ හේන | ඉහුරු මුදල ගෙවානැත (1) දිසානායක මුදියන්සේලාගේඋක්කුරාල, (2) අදිකාරිනායක මුදියන්සේලාගේ හින්ගිරිබන්ඩා (3) ලියනගෙදර පුන්චිරාල, (4) එම හින්ගිරිඅම්මා (වල්මෝරුවේ පදිංචි | හේන .. | 2 | 0 | 35 |
| 52 | වරගොල්ලේහේන .. | උඩහම්පහකෝරලේ අලවතුගොඩ පදින්චි උදුමාලෙබ්බේගේ සෙයියදුලෙබ්බෙ | එම .. | 0 | 2 | 20 |
| ·54 | එම .. | එම .. .. .. | දුංකල වැව්මට එලිකරලා | 0 | 1 | 23 |
| ·71 | උඩම්කාරදෙනිය හේන. | ආණ්ඩුව .. .. .. | හේන .. | 4 | 1 | 38 |

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 329 | කටුකෝන්ගහමුල තැන්නේහේන | නාරම්බේහේනයලෑගෙදර අප්පුවා හේනයා සහ කුඩාහේනයා .. | හේන .. | 3 | 1 | 8 |
| 357 | කටුකෝන්ගහමුලහේන. | උඩසියපත්තුවේ කොහොලන්වෙල පදිංචි කදරසසිඹුලාගේ අබුමේ | එම .. | 4 | 2 | 15 |

අක්කරයක තක්සේරුමිල රුපියල් 16 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1925ක්වූ ජූනි මස 17වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඒ. බී. ඇලෑක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තාරිස් විසින්.

---

**No. 7,231, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ජූලි මස 31වෙනි දිනවූ සිකුරාදා පස්වරු 2ට මාතලේ කානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ පලාතේ උතුරු මාතලේ උඩුගොඩ උඩසියපත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 19ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 33. ගම—මොරගස්පිටිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 19 | පාරයාගේහේන .. .. | ආණ්ඩුව .. | හේන .. | 4 | 2 | 17 |
| 49 | වැලිසේනෙත්පිල්ලෑව .. .. | එම .. | එම .. | 0 | 1 | 4 |
| 137 | අලවත්තේයාගේහේන .. .. | එම .. | එම .. | 1 | 0 | 22 |
| 170 | බෝගහමුලහේන .. .. | එම .. | එම .. | 2 | 1 | 25 |
| 179 | පොල්ගොල්ලේවලව්වේපන්හිලකුඹුරඳිලෑවේහේන | එම .. | එම .. | 0 | 2 | 7 |
| 213 | කහකුමාරවෙලපිල්ලෑවේහේන .. .. | එම .. | එම .. | 0 | 1 | 16 |
| 214 | බෝගහමුලහේන .. .. | එම .. | එම .. | 1 | 3 | 31 |
| 216 | වත්තේරාලගේවත්තහේන .. .. | එම .. | එම .. | 0 | 3 | 34 |
| 220 | කහකුමාරවෙලකුඹුරේපිල්ලෑවේහේන .. | එම .. | එම .. | 0 | 1 | 15 |
| 221 | කහකුමාරවෙලේවලව්වේහේන .. .. | එම .. | එම .. | 0 | 0 | 6 |
| 222 | කහකුමාරවෙලවැව .. .. | එම .. | වැව .. | 0 | 3 | 17 |
| 222½ | කහකුමාරවෙල .. .. | එම .. | ඇල .. | 0 | 0 | 5 |
| 223 | කහකුමාරවෙලකුඹුරේපිල්ලෑවේහේන | එම .. | හේන .. | 0 | 1 | 36 |
| 224 | කහකුමාරවෙලපිල්ලෑවේහේන .. .. | එම .. | එම .. | 1 | 2 | 22 |
| 253 | කලිඟුනසිඳෙගේහේන .. .. | එම .. | එම .. | 0 | 3 | 3 |
| 286 | උලඳවේහේන .. .. | එම .. | එම .. | 1 | 1 | 27 |
| 300 | කෝවිල්ලන්දේහේන .. .. | එම .. | එම .. | 6 | 3 | 23 |
| 304 | එම .. .. | එම .. | එම .. | 0 | 1 | 4 |
| 219 | කහකුමාරවෙලවලව්වේහේන .. .. | එම .. | එම .. | 17 | 0 | 32 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 16 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1925ක්වූ ජූනි මස 17වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඒ. බී. ඇලෑක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තාරිස් විසින්.

---

**No. 7,232, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ජූලි මස 31වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9·30ට නාලන්දේ කානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ පලාතේ උතුරු මාතලේ උඩුගොඩ උඩසියපත්තුකොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 33. ගම—මොරගස්පිටිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 138 | අලවත්තේයාගේහේන | (1) කොහොන පදිංචි අළුත්ගෙදර ජයවිරදුනුකාරමුදියන්සෙලාගේ කිරලා, (2) අළුත්ගෙදර පිංහාමි, (3) එම උක්කුඅම්මා, (4) එම කිරලා, (5) එම කව්අම්මා, (6) මාතලේ කාරොලිස්හාමි විසින් හිගමුදල් ගෙවානැත | හේන .. | 2 | 1 | 25 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 16 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1925ක්වූ ජූනි මස 17වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඒ. බී. ඇලෑක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තාරිස් විසින්.

---

**No. 7,233, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ජූලි මස 31වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9·30ට නාලන්දේ කානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ පලාතේ උතුරු මාතලේ උඩුගොඩ උඩසියපත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 35. ගම—දෙමඹගෙය.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 66 | මිදුනවයනහේන .. | (1) එගොඩගෙදර රංහාමි ආරච්චි, (2) කිරිහාමි, (3) රන්මැනිකා, (4) කිරිබන්ඩිරාල, (5) මින්ඩිරාල, (6) හේරත්හාමි | හේන .. | 1 | 1 | 27 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 16 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1925ක්වූ ජූනි මස 17වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඒ. බී. ඇලෑක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තාරිස් විසින්.

**No. 7,234, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 1වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 9.30ට රත්තොට ගම්සභාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ පලාතේ නැගෙනහිර මාතලේ අඹන්ගඟකෝරළේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 69. ගම—හුනුකැටඇල.

| නො. | ඉඩමේ නම. | | අයිතිකමකියන්නා. | අන්දම. | | මහන. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|
| 38 | අනිල්ලේමූකලාන | .. | ආණ්ඩුව .. .. . | මූකලාන | .. | 15 | 1 | 2 |
| 94 | කොස්ගහවත්තහේන | .. | මාතලේ නැගෙනහිර අදවල පදින්චි අදවල මිහ කනත්තේගෙදර සලු | හේන | .. | 0 | 1 | 21 |
| 96 | මිල්ලගහමැඩිත්තවත්ත | .. | (1) කොස්ගහගෙදර කිලිපු, (2) එම බන්ඩියා .. | වත්ත | .. | 0 | 1 | 13 |
| 123 | පල්ලේකුඹුරගොඩ | .. | ආණ්ඩුව .. .. .. | මගකැලේ | .. | 0 | 0 | 17 |
| 154 | උඩතැන්න.. | .. | එම .. .. .. | හේන | .. | 4 | 0 | 20 |
| 154A | එම | .. | එම .. .. .. | එම | .. | 2 | 1 | 23 |
| 154B | ඔඩහැලාහිරිය නොහොත් එපිටවත්තනොහොත් උඩතැනන | | අම්බාලේගොඩ විදානේගම් දෙන් අබුහමි අප්පුහාමි .. | හේන,කෙහෙල් ගස් තිබේ | | 0 | 1 | 32 |
| 154C | උඩතැන්න | .. | ආණ්ඩුව, (උඩගෙදර බින්දුවා සහ කොස්ගහගෙදර බන්ඩියාටත් බේරුදීමට) | හේන | .. | 2 | 0 | 16 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 16 සිට රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1925ක්වූ ජූනි මස 17වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලෙක්සන්ඩර්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්භ.

---

**No. 7,235, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 1වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 9.30ට රත්තොට ගම්සභාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ පලාතේ දකුණු මාතලේ ගම්පහසියපත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 71. ගම—දිග්ගල.

| නො. | ඉඩමේ නම. | | අයිතිකමකියන්නා. | අන්දම, | | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|
| 7 | ගමේයාය | .. | ආණ්ඩුව .. .. .. | හේන | .. | 4 | 3 | 8 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 75යි.

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1925ක්වූ ජූනි මස 17වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලෙක්සැන්ඩර්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්භ

---

**No. 7,236, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ජූලි මස 31වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9.30ට නාලන්දේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ පලාතේ උතුරු මාතලේ උඩුගොඩ උඩසියපත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 42. ගම—හෝමාපොල.

| නො. | ඉඩමේ නම. | | අයිතිකමකියන්නා. | අන්දම. | | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|
| 87 | මහයායේහේන | ... | ආණ්ඩුව .. .. .. | හේන | .. | 0 | 3 | 39 |
| 229A | වලව්වේහේන සහ වවුල්ගල්ලස | | ආණ්ඩුව, (1) හෝමාපොල පදින්චි පුන්චි අප්පුහාමි සහ (2) කිරපසිඩකාරයා විසින් ඉල්ලුම්කරනවා | මූකලාන | .. | 4 | 0 | 8 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 16 සිට රුපියල් 50 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1925ක්වූ ජූලි මස 17වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. ඊ. ඇලෙක්සැන්ඩර්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්භ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ශ්‍රෙෂ්ඨාධිකරණ මන්ත්‍රණ සභාවේ සම්මතය ඇතුව වර්ෂ 1911යේ 10වෙනි ආඥාපනතේ තුන්වෙනි වගන්තියෙන් ප්‍රකෘතිමත් වර්ෂ 1876යේ 3වෙනි ආඥාපනතේ 6වෙනි වගන්තියේ ප්‍රකාර ක්‍රියාකරණ ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් මෙහි පහත දක්වන ඉඩම් ප්‍රසිද්ධ කටයුත්තක් සඳහා එනම්, මාලිගාවත්තේ පාර වැඩිදියුණුකිරීමට උවමනා බැවින් මා විසින් එම ඉඩම් අයිතිකරගැනීමට යුතුප්‍රකාර අණලබනලදින්, ඒ ඉඩම් එනම් :—

ප්‍රාරම්භ ප්ලෑන නොම්මර 18,656. ගම—මරදාන.

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | විස්තරු. | අයිතිකම කියාසිටින අයගේ නම. | | විශාලකම අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ඉඩම | 40 ඇම්රිදි පමණ වයසැති පොල්ගස් 18ක් සහ පස් කෑනුවක කොටසක් අඩංගු තණකොළ වෙළ | බටුන්නට අයිති | .. | 4 | 2 | 24·30 |
| 2 | වරිපනම් නොම්මර 94 දරණ ඉඩමේ කොටසක් | 4 ඇම්රිදි වයසැති පොල් පැලයක් අඩංගු පොල් වත්ත කොටසක් | ඇම්. ඉස්මයිල් මීදින් | .. | 0 | 0 | 3·48 |

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | විස්තරය. | අයිතිකම කියාසිටින අයගේ නම | විශාලකම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 3 | දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ඉඩම | කුරුන්ද අඩංගු තණකොළ වෙල .. | ඔවුන්නට අයිති .. | 0 1 1·50 |
| 4 | වරිපනම් නොම්මර 44 දරණ ඉඩමේ කොටසක් | අතුවලින් සහ මඩින් කළ මඩුවක කොටසක්ද, වහලක් නැති ගලින්කල කාමරයක්ද, අතුවලින් සහ මඩින් කළ මඩුවක්ද අඩංගු වත්තක කොටසක් | සී. බී. නූර්දීන් .. | 0 0 11·80 |
| 5 | වරිපනම් නොම්මර 26 දරණ ඉඩමේ කොටසක් | 50 ඇවිරිදි පමණ වයසැති පොල්ගස් 30ක්ද, අතුවලින් සහ මඩින්කළ මඩුවක්ද, උළුසෙවිලිකළ ලිමඩුවක්ද, ගලින්කළ උළුසෙවිලිකළ ගොඩනැගිල්ලක්ද සහ උළුසෙවිලිකළ ගලින්කළ ගොඩනැගිල්ලක කොටසක්ද අඩංගු පොල්වත්තක කොටසක් | යූ. පී. උම්බිච්චි .. | 0 1 39·56 |
| 6 | වරිපනම් නොම්මර 30 දරණ ඉඩමේ කොටසක් | වත්තක කොටසක් (මුඩුඉඩම).. .. | රසීමරික්කාර් සිත්තලේ මරික්කාර් | 0 0 0·30 |
| | | | | 5 2 0·94 |

7වෙනි නියෝගයේ නියමවූ ප්‍රකාර ආණ්ඩුව ඉහතකී ඉඩම් අයිතිකරගැනීමට අදහස්කරණ බැව් මෙසින් ප්‍රකාශකරමි.

තවද එකී ඉඩම් ගැණ සැලකිමක් ඇති සියළුදෙනාම එකී ඔවුන්ගේ අයිතිවාසිකමේ අන්දමද ඒ වෙනුවට ඉල්ලාසිටින වටිනාකමද ඊට අයත් තවත් තොරතුරුද කියාසිටින පිණිස වර්‍ෂ 1925ක්වූ ජූලි මස 28වෙනි දින අඟහරුවාද උදේ 10.30ට තමුන්ම හෝ තමුන් වෙනුවෙන් ක්‍රියාකරණ අය හෝ මා ඉදිරිපිටට කොළඹ නාගරික සභා කන්තෝරුවට පැමිණෙන්ට ඔනෑකර තිබේ.

වර්‍ෂ 1925ක්වූ ජූනි මස 9වෙනි දින කොළඹ නාගරික සභා කන්තෝරුවේදීය.

එච්. ඒ. නියුන්හැම්,
කොළඹ නාගරික සභාවේ සභාපතිතැන වන සහ නගරාධිපතිතුමා

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කොළඹ උතුරු කොඨාසයේ ගංවතුර නැවැත්වීමේ උපක්‍රමය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 18,699. ගම—වේරගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වේරගොඩවෙල .. | තණකොලවත්ත .. | ඒ. මැන්දිස් යන අයගේ උරුමක්කාරයෝ .. | 0 0 13·63 |
| 2 | එම .. | එම .. | ඩබ්ලිව්. ඩයස් බන්ඩාරනායක .. | 0 0 37·53 |
| 3 | එම .. | එම .. | එම .. .. | 0 1 4·60 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1925ක්වූ ජූලි මස 13වෙනි දින දවල් 12හේ කාලයමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්‍ෂ 1925ක්වූ ජූනි මස 15වෙනි දින කොළඹ කච්චේරියේදිය.

ආර්. ඇන්. තේන්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—තලවකැලේ ප්‍රසිද්ධ මිනිපිච්චතියක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 7,809. ගම—තලවකැලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | රත්නිරුකැලේවත්ත .. | තේ ඉඩම .. | සිලෝන් ටී ප්ලාන්ටේෂන් සමාගම .. | 0 1 34·5 |

එබැවින් ඉඩම අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1925ක්වූ ජූලි මස 13වෙනි දින උදේ 10 කාලයමට නුවරඑළියේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඔනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්‍ෂ 1925ක්වූ ජූනි මස 10වෙනි දින නුවරඑළියේ කච්චේරියේදිය.

සී. හැරිසන් ජෝන්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—රේල්වේ දෙපාර්තමේන්තුව විසින් අල්ලාගණ තිබෙන ඉඩම්වලට ආණ්ඩුවේ බප්පු ලබාගැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් කිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 7,796. ගම—මාහාබොඩ.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා. | | | මහත. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ඇහැලගහමූල්ලේවත්ත | .. | මුඩුඉඩම | .. | අසනාලි | .. | .. | 0 | 0 | 2 |
| 2 | එම | .. | එම | .. | ලසිලා හබිබු | .. | .. | 0 | 0 | 5·1 |
| 3 | සේරගහමූල්ලේවත්ත | .. | එම | .. | මීඤපුල්ලේ | .. | .. | 0 | 0 | 5·6 |
| 4 | අලෙවෝටම | .. | එම | .. | සෙල්ලම්මා | .. | .. | 0 | 0 | 3·7 |
| 5 | හපුගහමූල්ලේවත්ත | .. | එම | .. | හමිදු .. | .. | .. | 0 | 0 | 2·2 |
| 6 | එම | .. | එම | .. | ඉස්මාපුල්ලේ | .. | .. | 0 | 0 | 1·2 |
| 7 | එම | .. | මුඩුඉඩම සහ කානුව | .. | මූහා ඉසුඹු | .. | .. | 0 | 0 | 3·3 |
| 8 | එම | .. | එම | .. | අනා සලේමා | .. | .. | 0 | 0 | 1·6 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1925ක්වූ ජූලි මස 16වෙනි දින දවල් 10යේ කනිසමට මාතලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1925ක්වූ ජූනි මස 15වෙනි
දින මාතලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඒ. හොබ්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වහන්සේ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—රේල්වේ දෙපාර්තමේන්තුව විසින් අල්ලාගන තිබෙන ඉඩම්වලට ආණ්ඩුවේ බප්පු ලබාගැණීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමානන්වහන්සේගෙන් කිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 7 794. ගම—ගොන්ගාවල.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා. | | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මාතලේ දුම්රිය ස්ථානේ ඉඩම | .. | වත්ත | .. | රොබට්සන් | .. | 0 | 0 | 1·6 |
| 2 | එම .. | .. | එම | .. | එම .. | .. | 0 | 0 | 0·6 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1925ක්වූ ජූලි මස 15වෙනි දින දවල් 10යේ කනිසමට මාතලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1925ක්වූ ජූනි මස 15වෙනි දින
මාතලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඒ. හොබ්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වහන්සේ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—රේල්වේ දෙපාර්තමේන්තුව විසින් අල්ලාගන තිබෙන ඉඩම්වලට ආණ්ඩුවේ බප්පු ලබාගැණීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමානන්වහන්සේගෙන් කිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 7,797. ගම—මාරුකොන.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා | | | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | අස්ගිරියේගෙදරවත්ත | .. | වත්ත | .. | කළුබන්ඩා | .. | .. | 0 | 0 | 25·9 |
| 2 | එගොඩහිරිය නොහොත් දෙනියේවත්ත | | මුඩුබිම | .. | විජේසූහාමි | .. | .. | 0 | 0 | 3·4 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙනබව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1925ක්වූ ජූලි මස 16වෙනි දින දවල් 1·30යේ කනිසමට මාතලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1925ක්වූ ජූනි මස 15වෙනි දින
මාතලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඒ. හොබ්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වහන්සේ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—රේල්වේ දෙපාර්තමේන්තුව විසින් අල්ලාගෙන තිබෙන ඉඩක්වලට ආණ්ඩුවේ ඔප්පු ලබා ගැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ; ඒ ඉඩම්නම් :—

සිතියමේ නො. 7,795. ගම—උක්කුවෙල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තවලන්තොයිගාව .. | තේ තිබේ .. | උක්කුවලවත්ත .. | .. 0 0 7·6 |
| 2 | එම .. | එම .. | කරුපන්සෙට්ටි .. | .. 0 0 2 |

එවැනි ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙනබව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1925ක්වූ ජූලි මස 15වෙනි දින දවල් 1·30ගේ කනිසමට මාතලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1925ක්වූ ජූනි මස 15වෙනි දින
මාතලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඒ. හොබ්ඩේ,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—නිලාවෙලි, කුච්චවෙලි පාරේ උප්පුවෙලියේ තිබෙන අන්තරාදායක ස්ථානය හරිගැස්සීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියමේ නො. 5,983. ගම—තිරිකුණාමලේ "ලෝකල් බෝඩ්" නගරයේ නො. 11 දරණ කොට්ඨාශය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | උතුරුවෙරලේ පාර නොහොත් මූලතිව්පාර | මහපාරේ කොටසක් .. | ආණ්ඩුව, භූවමාරුව පිණිස දීමට තිබේ | 0 0 13·75 |
| 3 | පට්ටාහිවිලවු නොහොත් කම්ට නාදපිල්ලයිවලවු | පරණ පොල්වත්තක කෑල්ලක්, පොල්ගස් 5ක් තිබේ | ඒ. රාසකෝන් | .. 0 1 0·66 |
| 4 | එම .. | වත්තක කෑල්ලක්, තාවකාලික ගෙයක් තිබේ | එම | .. 0 0 2·50 |

එබැවින් ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1925ක්වූ ජූලි මස 18වෙනි දින පෙරවරු 11ගේ කනිසමට තිරිකුණාමල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1925ක්වූ මැයි මස 30වෙනි දින
තිරිකුණාමලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඇල්. මර්ෆි,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මෝටර්බස් නැවත්වීමට ප්‍රසිද්ධ ස්ථානයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ. ඒ ඉඩමනම් :—

සිතියමේ නො. 5,638. ගම—කුරුණෑගල නගරයතුළ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | සන්තානා වීදියේ වරිපණම් නො. 12 | හිස්ඉඩම .. | නැසීගිය ජේනතන් ද සිල්වා මහත්මයාගේ උරුමක්කාරයෝ | 0 0 10·81 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1925ක්වූ ජූලි මස 22වෙනි දින පෙරවරු 10යේ කනිසමට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1925ක්වූ ජූනි මස 11වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ඇෆ්. ජී. ටිරල්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒ නම්:—බෝගමුව යන ගමෙහි ආණ්ඩුවේ පාඨශාලාවක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 5,619. ගම—කුරුණෑගල දිස්ත්‍රික්කේ වැඋඩවිලිහත්පත්තුවේ තිරගන්දහේ නැගෙනහිර කෝරළේ බෝගමුව.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 1 | මොරගොල්ලවත්ත | .. | පොල්වත්ත | .. | නැසීගිය ආර්. ඇස්. පීරිස් මහත්මයාගේ උරුමක්කාරයෝ | 0 0 37·5 |
| 2 | පින්කුඹුර | .. | පාළුකුඹුර | .. | බෝගමුව විහාරේ භාරකාරයා සහ කොළඹ සී. ජේ. මැතිව් | 0 0 37 |
| 3 | ගල්ලම්පොලවත්ත | .. | පොල්වත්ත | .. | කොළඹ සී. ජේ. මැතිව් .. .. .. | 0 1 1·8 |

එබැවින් ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙනබව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1925ක්වූ ජූලි මස 22වෙනි දින පෙරවරු 10යේ කනිසමට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1925ක්වූ ජූනි මස 11වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ඇෆ්. ජී. ටිරල්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒ නම්:—මිණීපිච්චෙටිනියකට පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම A. E. 2 of B. S. P. P. 671. ගම—කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනිහත්පත්තුවේ උඩපොල මැදලස්සකෝරළේ හොඳුපොල.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා. | මහත අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කැන්දගොල්ලේවත්ත | .. | පොල්වත්ත | .. | කුරුණෑගල, ඩබ්ලිව්. ඒ. සී. ද සිල්වා නීතිඥ මහත්මයා | 0 0 29 |

සිතියම A. E. 2 of B. S. P. P. 672. ගම—කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනිහත්පත්තුවේ උඩපල මැදලස්සේකෝරළේ පරබෑවිල.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | ගල්අඹගහමුලහේන | .. | පොල්වත්ත | .. | කුරුණෑගල, ඩබ්ලිව්. ඒ. සී. ද සිල්වා නීතිඥ මහත්මයා | 0 1 22 |

එබැවින් ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන්වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1925ක්වූ ජූලි මස 22වෙනි දින පෙරවරු 10යේ කනිසමට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1925ක්වූ ජූනි මස 11වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ඇෆ්. ජී. ටිරල්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මිනිපිච්චටනියකට මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 3,489. ගම—කෝන්ගොමුව.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා. | | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | බඩහැලයාහේනේකමත | .. | කමත | .. | යූ. ඒ අබ්දුල්කාරිම් | .. | .. 0 0 7·1 |
| 2 | බඩහැලයාහේන | .. | හේන | .. | එම | .. | .. 1 0 34 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1925ක්වූ ජූලි මස 17වෙනි දින පෙරවරු 11ගේ කනිසමට මාවනැල්ලේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1925ක්වූ ජූනි මස 9වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

ජේ. ආර්. වෝල්ටර්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මිනිපිට්ටනියකට මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 3,490. ගම—මාලියැද්ද.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | මීගහමුලතැන්නේවත්ත .. | වත්ත .. | පූන්චිබන්ඩා බැමිනිවත්ත සහ තවත් කෙනෙක් .. | 0 | 2 | 28·2 |
| 2 | නදවත්ත .. | එම .. | එම .. | 0 | 0 | 33·5 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1925ක්වූ ජූලි මස 17වෙනි දින පෙරවරූ 11යේ කාලයමට මාවනැල්ලේ ස්ථානයමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටිත මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්‍ෂ 1925ක්වූ ජූනි මස 9වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

ජේ. ආර්. වෝල්ටර්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍ග.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කුරුණෑගල දැන්වීම් නො. 8,831.]

වර්‍ෂ 1925ක්වූ ජූනි මස 19වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධ වර්‍ෂ 1897යේත් 1899යේ 1900යේ සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රීශ්වර යානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇෆ්. ලීච් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජ්ජුන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත් සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙසින් දැනගත යුතුයි.

ඇෆ්. ලීච්,
විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කිම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම්කිම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ හිරියාලහත්පත්තුවේ දිවිගන්දුනේ කෝරලේ එගොඩගම යන ගම පිහිටා තිබෙන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

ලංකාමැනීමේ මුල් සිතියම 1,958.

| බිම්කට්ටිය | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | ගුරුගල් ඇලගාවහේන (හක්වැටුන ඔයට ඉතුරුකර තිබෙන බිම) .. | 1 | 3 | 15 |
| 3 | ගන්සභාපාර (පාරට ඉතුරුකර තිබෙන බිම) | 0 | 1 | 6 |
| 4 | උල්පත්වැව ඇලලගහේන, කුඹුක්වේරලගේ හේන .. .. | 16 | 3 | 21 |
| 9 | තරණගොඩැල්ලගල (වැකන්දට ඉතුරුකර තිබෙන බිම) .. .. | 1 | 3 | 32 |
| 10 | කිඹිරිපොකුණමුකලාන .. .. | 157 | 2 | 33 |
| 11 | උල්පොතේහේන .. .. | 4 | 2 | 21 |
| 14 | දෙමටගල්ලේවැව (වැව සහ කන්ඩිය) .. | 16 | 2 | 31 |
| 17 | ඇල .. .. | 0 | 0 | 10 |
| 20 | කුඩාපාර .. .. | 2 | 0 | 6 |
| 23 | කන්ඩිය (පාලු) .. .. | 0 | 2 | 8 |
| 24 | ගන්ගොඩ .. .. | 0 | 0 | 11 |
| 25 | කුඹුක්වේරලගේහේන (කුඩාපාරට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 1 | 10 |
| 25½ | ගුරුගල්ඇලගාවහේන (කුඩා පාරට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 1 | 33 |
| 26 | ගුරුගල්ඇලහේන .. .. | 6 | 0 | 38 |
| 27 | ඇල .. .. | 0 | 0 | 4 |
| 28 | එම .. .. | 0 | 0 | 4 |
| 31 | එම .. .. | 0 | 0 | 20 |
| 32½ | හක්වැටුන ඔයෙන් කොටසක් .. | 2 | 0 | 22 |
| 34 | කොහොඹගහහේන .. .. | 2 | 0 | 33 |
| 35 | හක්වැටුන ඔයෙන් කොටසක් .. | 2 | 3 | 0 |
| 37 | ඇල .. .. | 0 | 0 | 3 |

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 39 | කන්ඩිය .. .. | 0 | 0 | 15 |
| 40 | පාලුගමවත්ත .. .. | 1 | 3 | 5 |
| 41 | එම .. .. | 0 | 0 | 15 |
| 42 | පින්වෙලහේන (වැකන්දට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 1 | 38 |
| 43 | අලුත්වැව (වැව සහ කන්ඩිය) .. | 2 | 1 | 33 |
| 44 | පොකුණ .. .. | 0 | 2 | 35 |
| 45 | පන්නුම්ගාවහේන (කන්ඩියට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 0 | 12 |
| 47 | බැදුරුගොල්ලේවැව (වැව සහ කන්ඩිය) . | 2 | 2 | 8 |
| 48 | පන්නුම්ගාවහේන .. .. | 10 | 0 | 5 |
| 49 | අඹිපාර .. .. | 0 | 0 | 6 |
| 50 | අමුහගාවහේන, අලුත්වැවේගාවහේන .. | 10 | 2 | 38 |
| 50½ | අලුත්වැවේගාවහේන (කුඩා පාරට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 1 | 26 |
| 51 | කටුවැවේගාවහේන (කුඩා පාරට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 1 | 19 |
| 52 | එම .. .. | 7 | 1 | 11 |
| 53 | අඹිපාර .. .. | 0 | 0 | 9 |
| 54 | කටුවැවේගාවහේන .. .. | 9 | 3 | 6 |
| 55 | මිනිපිටිය .. .. | 0 | 0 | 16 |
| 56 | කටුවැව (වැව සහ කන්ඩිය) .. | 3 | 3 | 28 |
| 57 | වැවඉහලහේන (වැකන්දට ඉතුරුකර තිබෙන බිම) .. .. | 1 | 0 | 15 |
| | | 269 | 0 | 21 |

මීට මායිම්—උතුරට උල්පත් ඇලද (උල්පත්වැව යන ගමේ ගම්ඉමද), උල්පත්වැව යන ගමේ ගම්ඉමද, බලගොල්ල යන ගමේ ගම්ඉමද; නැගෙණහිරට බලගොල්ල යන ගමේ ගම්ඉමද, මාඑලිය යන ගමේ ගම්ඉමද; දකුණට මාඑලිය යන ගමේ ගම්ඉමද, දූගම යන ගමේ ගම්ඉමද; බස්නාහිරට කොරුවාව යන ගමේ ගම්ඉමද, (හක්වැටුන ඔයෙන් කොටසක්ද) ගලවැව යන ගමේ ගම්ඉමද (හක්වැටුනු ඔයෙන් කොටසක්).

ඉහතකී මාසිකවලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මේ දැන්වීමෙන් අත්හැරියවගත් ඒවායේ මුළු බිම්තරම වන අක්කර 133කුත් රූඩ් 3කුත් පර්චස් 34ක ඉහතකී අක්කර 269කුත් පර්චස් 21කේ බිම්තරමේ අඩංගු නොවන වගක් මෙයින් දැනගත යුතුයි.

ලංකාමැනීමේ මුල් සිතියම 1,958.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|---|
| A 2 | බුසගාවවත්ත | 1 | 0 | 18 | C 29 | තොරගොල්ලේකුඹුර | 11 | 2 | 14 |
| A 2½ | එම | 0 | 0 | 33 | C 30 | අච්චිගේවලහේන | 2 | 1 | 21 |
| B 5 | වැවපත්අලවත්ත | 0 | 2 | 16 | C 32 | බයගාවවත්ත | 3 | 1 | 8 |
| B 6 | කදුරුගහවත්ත | 1 | 0 | 34 | C 33 | කොහොඹගහකුඹුර | 4 | 1 | 31 |
| B 7 | තුත්තිරිවෙලගල | 1 | 1 | 14 | C 36 | බයගාවහේන, කුඩාවැවගාවහේන (84 289 යන පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩම) | 70 | 3 | 15 |
| B 8 | දන්ගහවත්ත | 1 | 2 | 20 | C 38 | කටුවාවේකුඹුර | 4 | 2 | 29 |
| B 15 | වැවෙපත්අලවත්ත | 0 | 3 | 2 | D 13 | ඉහලගාවවත්ත | 2 | 0 | 0 |
| B 16 | ගත්ගොඩ | 5 | 1 | 0 | D 46 | දෙමටගොල්ලේ ඉහලවෙල | 1 | 2 | 11 |
| B 18 | දෙමටගොල්ලවෙල, පින්වෙල | 14 | 0 | 12 | 12 | උල්පොතේවෙල | 0 | 2 | 37 |
| B 19 | දෙමටගොල්ලවෙල | 0 | 1 | 30 | | | | | |
| B 21 | තාවෙලකුඹුර | 0 | 1 | 28 | | | | | |
| B 22 | දෙමටගොල්ලේයාය, තාවෙලකුඹුර | 5 | 1 | 21 | | | 133 | 3 | 34 |

[කුරුණෑගල වි. ම. 23—1925.]

---

[කුරුණෑගල දැන්වීම නො. 8,832.]

වර්ෂ 1925ක්වූ ජූනි මස 19වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් ඉඩ්ඩම් සම්බන්ධව වර්ෂ 1897 සහ 1899යේ 1900යේ සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මනාද්‍යිශවරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඈම්. ටී. ආර්චිබෝල්ඩ් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මනාද්‍යිශවරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඈම්. ටී. ආර්චිබෝල්ඩ්,
විශෙෂ මනාද්‍යිශවරයානන්නාන්සේ.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කිම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කිම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොල හත්පත්තුවේ මැද්දේකැටියකෝරලේ තල්ලියද්ද යන ගම පිහිටා තිබෙන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—මුල් සිතියම 5,469.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 5 | පරගහමුලවත්ත | 0 | 0 | 25 |
| 7 | විලදගහමුලහේන නොහොත් දන්ගහමුලහේන | 16 | 0 | 4 |
| 8 | එම | 0 | 0 | 16 |
| | | 16 | 1 | 5 |

මීට මායිම්—උතුරට ගජුවා සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන කහටගහමුලහේනද, රජසන්තක කැලේද; නැගෙනහිරට රජසන්තක කැලේද; දකුණට වත්තුවා සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන පරගහමුලහේනද; බස්නාහිරට ගන්සභාපාරද, ලැබූනා සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන වැව්ගාවහේනද, ආණ්ඩුව විසින් විකුණපු පරගහමුලවත්තද, පාලුකන්ඩියද (උඩවැව යන පරණ පාලුවැව.)

II.—මුල් සිතියම 5,469.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 9 | අගාරේහේන | 0 | 3 | 1 |

මීට මායිම්—උතුරට ආර්. ඈම්. අප්පුහාමි විසින් අයිතිවාසිකම්කියන ඉස්වැටියහේනද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණපු අගාරේහේනා; දකුණට සුරේන්දර සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන රකිණකොටුවහේනද; බස්නාහිරට ගන්සභාපාරද.

[කුරුණෑගල වි. ම. 24—1925.]

---

[කුරුණෑගල දැන්වීම නො. 8,833.]

වර්ෂ 1925ක්වූ ජූනි මස 19වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් ඉඩ්ඩම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශවරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඈම්. ටී. ආර්චිබෝල්ඩ් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රිශවරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩම හැටියට උන්නාන්සේගේ අත්සන ඇතිලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඈම්. ටී. ආර්චිබෝල්ඩ්,
විශෙෂ මන්ත්‍රිශවරයානන්නාන්සේ.

(*a*) මෙම ඉඩම ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම උඩින් යන යම් පාරකට අයිතිකම්කිම, ඒ ඉඩමට අයිතිකම්කිම හැටියට බාරගනු ලැබේ.

## ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදිහත්පත්තුවේ ගිරතලානකෝරළේ හුගවෙලගම යන ගම පිහිටා තිබෙන ලංකාමැනීමේ නොම්මර 1,801 දරණ මුල් සිතියමේ පෙනියන පර්චස් 28ක බිම්තරම ඇති නොම්මර 10ඎ දරණ හැලඹගහමුලගහහේන (වෙල්ලට ඉතුරුකර තිබේ) කියන බිම්කට්ටිය, මීට මායිම්—උතුරට ගෙලඹගහමුලවත්ත (362,896 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම); නැගෙණහිරට මුඩුබිම් රෙකුලාසියෙන් රජසන්තක කරණලද කෝන්ගහමුලහේන්යායද; දකුණට වෙලිඇලද, බස්නාහිරට ගලගාවවෙලද (ප්‍රවේනි.)

[කුරුණෑගල වි. ම. 25—1925.]

---

[කුරුනෑගල දූත්වීම නො. 8,834.]

වම් 1925ක්වූ ජූනි මස 19වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වූ 1897වෙත් 1899යේ 1900යේ සහ 1903වෙත් ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇම්. ට්. ආචිබෝල්ඩ් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ල කින් එකී ඉඩම්වලට නොහොත් ඒව ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැරදක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇම්. ට්. ආචිබෝල්ඩ්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

## ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කයේ හිරියාලහත්පත්තුවේ දිවිගන්දහේකෝරළේ නැකති මුදුගොමුව යන ගම පිහිටා තිබෙන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

### ලංකාමැනීමේ මුල් සිතියම 1,964.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 3 | මැදලන්දේහේන .. .. | 3 | 1 | 21 |
| 5 | එම .. .. | 1 | 0 | 26 |
| 6 | දෙවෙලියහේන, මැදලන්දේහේන .. | 5 | 0 | 11 |
| 8 | ඇල .. .. | 0 | 0 | 19 |
| 9 | පාලුවත්තයාය, දෙවෙලියහේන, හබයායහේන්යාය, අගුරුපුස්සපු ගල්වලහේන .. | 64 | 2 | 3 |
| 11 | කුඹුක්ගහමුලවැව (වැව සහ කන්ඩිය) .. | 3 | 1 | 8 |
| 12 | අගුරුපුස්සපු ගල්වලහේන .. | 0 | 0 | 11 |
| 15 | කුරුවියවැව (වැව සහ කන්ඩිය) .. | 8 | 0 | 8 |
| 16 | මැදලන්දේගල (වෑකන්දට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 1 | 26 |
| 18 | ඇල .. .. | 0 | 1 | 2 |
| 23 | ගන්සභාපාර .. .. | 0 | 0 | 24 |
| 24 | දියුල්වෙලහේන .. .. | 1 | 2 | 26 |
| 27 | කුරිවියාවේයාය, කෝන්ගහමුලහේන .. | 8 | 3 | 39 |
| 31 | ඇල .. .. | 0 | 0 | 12 |
| 33 | මීගහමුලහේන(වෑකන්දටඉතුරුකරතිබෙනබිම) | 0 | 0 | 22 |
| 34 | පනුකප්පේයාය, මීගහමුලහේන .. | 2 | 1 | 1 |
| 35 | ගලගාවවැව (වැව සහ කන්ඩිය) .. | 3 | 2 | 16 |
| 36 | ගන්සභාපාර .. .. | 2 | 3 | 4 |
| 39 | දූදුන්ගලහේන්යාය හබයායහේන්යාය, උල්පතියාය, පනුකොබෑයාය, වැවේ ඉහලයාය .. .. | 107 | 3 | 36 |
| 40 | උල්පතහේන (මිනිපිට්ටනිය) .. | 0 | 3 | 39 |
| 41 | අඩිපාර (මිනිපිට්ටනියට යන පාර) .. | 0 | 0 | 7 |
| 42 | එම .. .. | 0 | 0 | 7 |
| 43 | කොටුවපිටියහේන .. .. | 4 | 1 | 19 |
| 44 | මීරගලමූකලාන .. .. | 16 | 0 | 29 |
| 45 | අඩිපාර .. .. | 0 | 0 | 9 |
| 46 | මීරගලමූකලාන .. .. | 4 | 0 | 12 |
| 48 | බෝගහයායමූකලාන .. .. | 29 | 1 | 17 |
| | | 269 | 0 | 14 |

මීට මායිම්—උතුරට රම්බේ සහ අගාරෙ යන ගම්වල ගම්ඉම්ද ; නැගෙනහිරට තල්වෙහෙර සහ ඉහලඹතොට කෝරළේ උතුරුවැල්ල යන ගම්වල ගම්ඉම්ද ; දකුනට තාම්බුව යන ගමේ ගම්ඉමද ; බස්නාහිරට තාම්බුව සහ රම්බේ යන ගම්වල ගම්ඉම්ද රම්බේ යන ගමේ ගම්ඉමද, (රම්බේ සිට තිබෙන ගන්සභා පාරෙන් කොටසක්), රම්බේ යන ගමේ ගම්ඉමද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මේ දූන්වීමෙන් අත්හැරියවගත්, ඒවායේ මුලු බිම්තරමවන අක්කර 57කුත් පර්චස් 7ක ඉහතකී අක්කර 269කුත් පර්චස් 14ගේ බිම්තරමේ අඩංගුනොවනවගත් මෙයින් දැනගත යුතුයි.

### ලංකාමැනීමේ මුල් සිතියම 1,964.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| A 1 | මැදලන්ද .. .. | 1 | 0 | 14 |
| A 2 | මැදලන්දේවත්ත .. .. | 1 | 1 | 29 |
| A 4 | එම .. .. | 5 | 0 | 14 |
| A17 | මැදලන්දේගල .. .. | 2 | 1 | 19 |
| A19 | දියුල්වෙල .. .. | 0 | 0 | 28 |
| A20 | දියුල්වෙල, දියුල්වෙලවත්ත (84,313 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම) .. | 15 | 1 | 0 |
| A21 | දියුල්වෙල, දියුල්වෙලවත්ත .. | 0 | 1 | 0 |
| A22 | දියුල්වෙල, අඹගහමුලගල .. | 3 | 3 | 14 |
| A25 | දියුල්වෙලවත්ත .. ... | 0 | 2 | 39 |
| A26 | එම .. .. | 2 | 3 | 28 |
| B 7 | දඹගහකුඹුර, කුඹුගහකුඹුර .. | 8 | 2 | 26 |
| B13 | මුකුල්ගහකුඹුර (84,293 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම) .. .. | 2 | 1 | 12 |
| B14 | එම .. .. | 0 | 2 | 8 |
| B28 | බෝගහමුලගල, කෝන්ගහමුලගල .. | 2 | 2 | 22 |
| B29 | මකුල්ගහකුඹුර .. .. | 0 | 0 | 7 |
| B30 | මීගහකුඹුර .. .. | 2 | 2 | 27 |
| B32 | වැවඉහලගල, මීගහමුලගල .. | 1 | 1 | 36 |
| 37 | එම (367,420 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම) .. .. | 1 | 0 | 35 |
| 38 | වැවඉහලගල (367,332 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම) .. .. | 1 | 2 | 39 |
| 10 | එම (367,424 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම) .. .. | 0 | 1 | 25 |
| 47 | විරගලපන්සල .. .. | 2 | 0 | 25 |
| | | 57 | 0 | 7 |

[කුරුනෑගල වි. ම. 26—1925.]

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

වර්ෂ 1925ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1926 සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මෙහි පහත සඳහන් වන මධ්‍යම දිසාවේ තොටුපල් රේන්ද මිලේට ගැණීම පිණිස දෙන්ට යෙදෙන "ටැන්ඩර්ස්" ඉල්ලුම්පත්‍ර වර්ෂ 1925ක්වූ ජූලි මස 21වෙනි අඟහරුවාදා පස්වරු 2ට මහනුවර කච්චේරියේදී මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාර ගන්ට යෙදෙන බව මෙයින් දැනුම්දෙමි.

භාරගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ගත් මුදලෙන් දහයෙන් කොටසක් සල්ලිවලින් වහාම මෙහි බැඳ තබන්ට ඕනෑය. එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාර ගන්ට යෙදුනොත්විනම්, ඔහුගේ ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් ඒත්තුගත් බව ඔහුට දැනුම්දුන් දින පටන් 30ස් දවසක් ඇතුළතදී එම ඉල්ලූ ගණනෙහන් දෙකෙන් පංගුවක් වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ සම්පූර්ණකරන්ට ඕනෑය.

ඇප පිණිස තිබනලද ඔප්පු සෝදිසිකිරීමට සහ ඒවා ගැණ කල්පනාව දීමටත් ගෙවියයුතු ගාස්තුවද, ඒවා සෑදීමට සහ සෝදිසිකර සම්පූර්ණකිරීමටත් ආණ්ඩුවේ අද්වකාත් උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුද, ඉඩම් තක්සේරුකිරීමට සහ ඇප ඔප්පු රීජිස්තර්කිරීමට ගෙවියයුතු ගාස්තුත් ඔහු විසින් ගෙවන්ට ඕනෑවා පමණකුත් නොව ඇප ඔප්පුවට වර්ෂ 1909ක්වූ අවුරුද්දේ නොම්මර 22කේ ආඥාපණතේ අන්දමට නියම මුද්දර ගාස්තුවත් ගෙවන්ට ඕනෑය.

ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු සියල්ලම මීට පුර්ම වෙන ඇපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රීජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් සමග එවිය යුතුයි. මේම සහතිකපත්‍රය ඇප තබන අයගේ වියදමෙන් ලබාගන්ට ඕනෑය.

රේන්දකාරයාගේ හෝ ඔහුගේ වැඩකාරයන්ගේ නොසැළකීම නිසා ඔරු අළුත්වැඩියාකරන්ට සිදුවුනොත් එසේ කිරීමට යන වියදම රේන්දකාරයා විසින් ගෙවිය යුතුය. ඒට ඇපයක් වශයෙන් රුපියල් 100ක් වහාම බඳින්ට ඕනෑය.

මේ ගැණ වැඩිදුර කාරණා ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගත හැකිවේ.

විකිණීමට තිබෙන රේන්දනම්:—

වේරගංතොට තොටුපල් රේන්දය.

ඩබ්ලිව්. ඇල්. කිංඩර්ස්ලි,
මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1925ක්වූ ජූනි මස 16වෙනි
දින මහනුවර කච්චේරියේදීය.

---

## ආණ්ඩුවේ ඉඩම් මිලේට ගැනීම හෝ බදුගැනීමට දෙන ඉල්ලුම්පත්‍ර.

ආණ්ඩුව සන්තක ඉඩම් මැනීමේ අයදුම්පත්‍ර පිළිබඳව උතුරු මධ්‍යම පලාතේ අවසානකරණු ලබන භූමි ප්‍රදේශ.

උතුරු මධ්‍යම පලාතේ ආණ්ඩුව සන්තක ඉඩම් මුදලට ගැනීමේදී යවනු ලබන අයදුම්පත්‍ර සම්බන්ධව පවත්වනු ලබන මැණීම් එම භූමිවල අක්කර ප්‍රමාණයේ හැටියට මින් ඉදිරියට භාරගන්නා බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. එම පලාත ප්‍රදේශ තුනකට බෙදා තිබේ.

කුන්චුත්තු, කල්පේ, මහාපොතාන, කනදරා සහ උඩ්ඩියන් කුලම කෝරල අංක 1 දරණ ප්‍රදේශයට ඇතුළත්වද.

උලගල්ල, කලාගම් නිගම්පහ, උන්දුරුව, කිරලාව, මාමිනිය සහ මානොම්බුව කෝරලද, තමන්කඩුව සහ එගොඩ පත්තුද අංක 2 දරණ ප්‍රදේශයට ඇතුළත්වද.

විල්ලච්චිය, නුවරගම්, කඩවත්, එප්පාවල සහ කැඳුකෝරල අංක 3 දරණ ප්‍රදේශයට ඇතුළත්වද වේ.

3. වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 1වෙනි දින අංක 1 දරණ භූමි ප්‍රදේශයේ කටයුතු අවසාන කරනුලැබේ මෙහි තුළ පිහිටි ඉඩම් සම්බන්ධ යවනලද අයදුම්පත්‍ර ඉහතකී දිනට පසු එම ඉඩම් මැණීම පිණිස සර්වේයර් ජනරල් උන්නාන්සේ වෙත යවනු නොලැබේ එසේද උවත් ඉඩම් විකිණීම ගැන යම් විරුඩකම් තිබේදැයි දැනගැනීමට එකී ප්‍රදේශය තුළ ඉඩම් ගැන එවනලද අයදුම්පත්‍ර රෙජිස්ටර්කිරීම පිණිස මාවෙත එවීම වලක්වනු නොලැබේ.

4. මීට පසු මැණීම පිළිබඳව අවසානකරනු ලබන්නේ අංක 2 දරණ ප්‍රදේශයද, ඒට පසු පිළිවෙලින් අංක 3 දරණ ප්‍රදේශයද වේ. මෙකී භූමි ප්‍රදේශ 2 තුළ ආණ්ඩුව සන්තක ඉඩම් මිලේට ගැනීම පිණිස එවනලද අයදුම්පත්‍ර නොපමාව මාවෙත එවිය යුතුයි.

5. අංක 2 දරණ භූමි ප්‍රදේශයේ අයදුම්පත්‍ර භාරගැනීමේ අවසානකරණ දිනය ලඟදීම ප්‍රසිඩකරනු ලැබේ. තවද අංක 1 දරණ භූමි ප්‍රදේශයේ සියලු කටයුතු සම්පූර්ණකරන දිනයද ඉන් ප්‍රකාශවෙන්.

මෙළවගට,

වර්ෂ 1925ක්වූ ජූනි මස 1වෙනි දිනදීය.

ඇෆ් බාච්ලර්,
උ. ම. ප. ඒජන්ත උන්නාන්සේය.

---

## සුප්‍රිම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබීතිබෙන අඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශ කරන්නේනම්, රත්නපුර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1925ක්වූ ජූලි මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යවකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

වර්ෂ 1925ක්වූ ජූනි මස 13වෙනි දින
රත්නපුර පිස්කල් කන්තෝරුවේදීය,

ටී. ඒ. කොඩිසන්,
පිස්කල් වමින.

H. ROSS COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.